මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :PRE/2024/65** **2024.09.04**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ට, ඡන්ද විමසීම්වල දී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම.

තම ඡන්දය දීමට හැකි වනු පිණිස සේවා නියුක්තීන්ට නිවාඩු දීමට සේවා යෝජකයන් කටයුතු කළ යුතු බවට 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 110 වැනි වගන්තියෙන් (2023 අංක 21 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියේ සංශෝධිත) විධිවිධාන සලසා ඇති අතර 2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ දී ද එය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුව ඇත.

02. රාජ්‍ය අංශයේ, නිලධරයන්ගේ විශේෂ නිවාඩු පිළිබඳව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 12.3 ඡේදයේ දක්වා ඇති පරිදි, ජනාධිපතිවරණයක් සඳහා අවම කාලය පැය 4 ක් ලෙස ද ඡන්දය ප්‍රකාශ කිරීමට යාම පිණිස අවශ්‍ය යැයි හැඟෙන අඛණ්ඩ කාලයක් සඳහා වැටුප් අඩු කිරීමක් නොමැතිව විශේෂ නිවාඩු ලබාදිය යුතු බව ද දක්වා ඇත.

03. එසේ වුව ද පෞද්ගලික අංශයේ, සේවා නියුක්තීන්ට ලිඛිත නියමයකින් පැන වූ එවැනි විශේෂ නිවාඩු ලබාදීමේ ක්‍රම වේදයක් නොමැති හෙයින් බොහෝ සේවා යෝජකයන් තම සේවා නියුක්තීන්ට ඡන්දය පාවිච්චි කිරීම සඳහා වූ නිවාඩු ලබා නොදෙන බවට ලද පැමිණිලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව, මැතිවරණ කොමිෂන් සභාව සමඟ මින් පෙර සාකච්ඡාවේ දී ඇති කර ගන්නා ලද එකඟතාව අනුව පෞද්ගලික අංශයේ සේවකයින්ට ඡන්ද විමසීමක දී ඡන්දය පාවිච්චි කිරීමට යෑමට හා ඊමට නිවාඩු ලබාදීම සඳහා දුර හා කාලය අතර සම්බන්ධතාවක් සකස් කරන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරන ලද දැන්වීම අනුව මතු සඳහන් වගුවට අනුකූලව පෞද්ගලික අංශයේ සේවය කරන්නා වූ සේවක සේවිකාවන්ට, සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වූ නිවාඩු ලබාදීමට අදාළ සේවා යෝජකයින් කටයුතු කිරීම සුදුසු බවට නිර්දේශ කරන ලදී.

| ඡන්දය පාවිච්චි කිරීම සඳහා සේවා ස්ථානයේ සිට තම ඡන්ද පොළට යායුතු දුර ප්‍රමාණය | ලබාදිය යුතු අවම නිවාඩු කාල සීමාව |
|---|---|
| කිලෝමීටර් 40 හෝ ඊට අඩු නම් | දින භාගයයි ( ½ ) |
| කිලෝමීටර් 40 ත් කිලෝමීටර් 100ත් අතර නම් | දින එකයි ( 1 ) |
| කිලෝමීටර් 100 ත් කිලෝමීටර් 150ත් අතර නම් | දින 1 1/2 යි |
| කිලෝමීටර් 150 ට වැඩි නම් | දින 2යි |

04. ඉහත සටහනින් යෝජනා කර ඇත්තේ ලබා දිය යුතු අවම කාලය වන අතර දිවයිනේ සමහර ඡන්දදායකයින්ට ස්වකීය ඡන්ද පොළට යෑමට හා ඊමට දින තුනක් ගත වන අවස්ථා ද සැලකිය යුතු සංඛ්‍යාවක් තිබෙන හෙයින් අවස්ථාවෝචිතව දින තුනක් නිවාඩු දීමට සිදු වන බවද සැලකිල්ලට ගත යුතු වේ.

05. මෙහිදී, සේවා නියුක්තීන් විසින් ලිඛිත ඉල්ලීමක් මඟින් නිවාඩු ඉල්ලුම් කළ යුතු අතර, සෑම සේවා යෝජකයකු විසින්ම විශේෂ නිවාඩු ඉල්ලුම් කළ තැනැත්තන් හා නිවාඩු ප්‍රදානය කරන කාලසීමාව දැක්වෙන ලේඛනයක් පිළියෙළ කර එය, සේවා ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු ද වේ.

06. ඉහත සඳහන් විධිවිධාන හා නිර්දේශවලට අනුකූලතාව දක්වමින් ස්වකීය ආයතනයේ සේවා නියුක්තීන්ට ඡන්දය දීමට යෑමට හා ඊමට ප්‍රමාණවත් නිවාඩු ලබා දෙන ලෙස සියලුම සේවායෝජකයන් වෙතින් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්